# ද මැසිනොද් විදුහල - කඳාන
# පළමු වාර පරීක්ෂණ - 2024
# කතෝලික ධර්මය I

Learning Resource Centre R De Mazenod College Kandana

10 ශ්‍රේණිය කාලය පැය 01

2024.06

**✳ දී ඇති වරණ 04 අතරින් වඩාත් නිවැරදි වරණය තෝරා කතිර සලකුණු යොදන්න.**

01. පුරාණ ගිවිසුමේ පොත් වර්ගීකරණය කරන ප්‍රධාන කොටස්,
i. 02 කි. ii. 04 කි. iii. 05 කි iv. 07 කි

02. මේවා අතරින් ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථයක් නොවන්නේ,
i. හිතෝපදේශය ii. ධර්මදේශකයා
iii. ලෙවී ව්‍යවස්ථාව iv. උපදේශකයා

03. නව ගිවිසුමේ ප්‍රධාන පොත් කාණ්ඩ,
i. 05 කි. ii. 04 කි. iii. 06 කි. iv. 03 කි.

04. සුභාරංචි හා ක්‍රියා පොත යන ග්‍රන්ථ 05 අතරින් ග්‍රන්ථ 02 ක කතෘත්වය දරණ පුද්ගලයා කවුරුන්ද ?
i. මතෙව්තුමා ය. ii. මක්තුමා ය.
iii. ලූක්තුමා ය. iv. ජොහාන්තුමා ය.

05. මුල් කිතුනු සභාව ආරම්භ වූ ආකාරයත් පේදුරු හා පාවුළුතුමන්ලාගේ ක්‍රියා පිළිබඳවත් සඳහන් කරන ග්‍රන්ථය වන්නේ,
i. ලූක් සුභාරංචිය. ii. ජුවාම් සුභාරංචිය
iii. එළිදරව් සුභාරංචිය iv. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත.

06. නව ගිවිසුමේ ඇති සංදේශ ගණන වනුයේ,
i. 08 කි. ii. 13 කි. iii. 21 කි. iv. 24 කි.

07. ගීතාවලියේ ඇති සම්පූර්ණ යාච්ඤාමය ගීතිකා ගණන වනුයේ,
i. 120 කි. ii. 121 කි iii. 150 කි. iv. 155 කි.

08. ශු. සභාවේ නිල යැදුම වනුයේ,
i. ස්වර්ගයේ වැඩසිටින යැදුම. ii. නමෝ මරිය යැදුම.
iii. තුන්කාලයේ ආරාධනාව iv. යාම යැදුම.

09. පළමුව ග්‍රන්ථාරූඪ වූ සුභාරංචි ග්‍රන්ථය වන්නේ,
i. ලූක් සුභාරංචිය. ii. මාක් සුභාරංචිය.
iii. මතෙව් සුභාරංචිය. iv. ජොහාන් සුභාරංචිය.

10. පහත දැක්වෙන ඒවා අතරින් ජොහාන් සුභාරංචිය හඳුන්වන අන්වර්ථ නාමය වන්නේ,
i. ශු. සභාවේ සුභාරංචිය. ii. දුක් ප්‍රාප්තියේ සුභාරංචිය.
iii. දේව රාජ්‍යයේ සුභාරංචිය. iv. අධ්‍යාත්මයේ සුභාරංචිය

11. "බැටළුවන්ට .................. මම වෙමි. (ජොහාන් 10:7) හිස්තැනට වඩාත් සුදුසු වන්නේ,
i. එඬේරා. ii. ආලෝකය. iii. ජීවනය. iv. දොරටුව.

12. ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා බවත් උන්වහන්සේ අදහා ගැනීමෙන් සදාතන ජීවනය ලැබෙන බවත් ඉගැන්වීමට තම සුභාරංචිය ලියන ලද්දේ,
i. ලූක් තුමා ii. ජුවාම් තුමා iii. මතෙව් තුමා iv. මාක් තුමා

13. "සියොන්" යනුවෙන් හඳුන්වනු ලැබුවේ,
i. ජුදයාව. ii. ඊශ්‍රායෙලය. iii. පලස්තීනය. iv. ජෙරුසලම.

14. ශු. බයිබලය ග්‍රන්ථාරූඪ කර ඇති කාලවකවානුව ලෙස සලකනු ලබන්නේ,
i. ක්‍රි.ව. 950 - ක්‍රි.ව. 100 ii. ක්‍රි.පූ. 950 - ක්‍රි.පූ. 100
iii. ක්‍රි.පූ. 950 - ක්‍රි.ව. 100 iv. ක්‍රි.ව. 950 - ක්‍රි.පූ. 100

15. නව ගිවිසුමේ පළමුව ලේඛණගත වූ සුභාරංචි ග්‍රන්ථය වන්නේ,
i. ලූක් ii. මාක් iii. මතෙව් iv. ජොහාන්

16. පුද්ගලයින් හෝ ජනතාවගේ ගැටළු හා ඒවාට විසඳුම් දේවවේදිය දෘෂ්ටිකෝණයකින් ඉදිරිපත් කර ඇති ග්‍රන්ථ වන්නේ,
i. එස්රා හා නෙහෙමියා. ii. ජෝෂුවා සිට II රාජාවලිය
iii. රූත් කථාව හා එස්තර් iv. ලෙවී ව්‍යවස්ථාව හා ගණන් කථාව.

17. ලේඛණගත වී නොමැති ජේසුස් වහන්සේ කළ කී දෑ බොහෝමයක් ශු. සභාව විසින් අපට දානය කරනු ලබන්නේ,
i. වාචික සම්ප්‍රදායෙනි. ii. පූජක සම්ප්‍රදායෙනි.
iii. යාවේ සම්ප්‍රදායෙනි iv. ජීවන සභා සම්ප්‍රදායෙනි.

18. "ස්වාමින් වහන්සේගේ වචනය සදහටම පවතී. මේ වචනය නම් ඔබට දේශනා කරන ලද සුබ අස්නය." මෙසේ දේව වචනයට සාක්ෂි දරන්නේ,
i. පේදුරු තුමා. ii. ජුවාම් තුමා. iii. ජාකොබ් තුමා. iv. මාක් තුමා.

19. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත රචනා වී ඇත්තේ,
i. ක්‍රි.ව. 80 ත් - 90 ත් අතර ii. ක්‍රි.ව. 90 ත් - 100 ත් අතර
iii. ක්‍රි.ව. 85 ත් - 95 ත් අතර iv. ක්‍රි.ව. 88 ත් - 108 ත් අතර

20. ශු. බයිබලයේ ඇති වෙනත් ලිපි සංඛ්‍යාව,
i. 13 යි. ii. 10 යි. iii. 21 යි. iv. 8 යි.

21. I කොරෙන්ති ලිපිය අයත් වන්නේ,
i. ද්විතීය පාවුළු ii. ආරූඪ කතෘත්වය
iii. පාවුළුතුමා විසින් ලියූ ලිපි iv. වෙනත් සංදේශ

22. පහත දැක්වෙන ඒවා අතරින් ආරූඪ කතෘත්වයෙන් යුතු ලිපියක් නොවන්නේ කුමන ලිපියද?
i. II තෙසෙලෝනික ii. I තිමති. iii. II තිමති. iv. තීතස්.

23. කිතුනු අපගේ ගැලවීම්දායක ප්‍රේමයේ සළකුණ වන්නේ,
i. දිව්‍ය සත්ප්‍රසාදය
ii. දිව්‍ය පූජාව
iii. ශු. කුරුසිය
iv. ශු. ජපමාලය

24. එළිදරව් සාහිත්‍යයේ රතු වර්ණයෙන් අර්ථ දක්වන්නේ,
i. ජගග්‍රහණය.
ii. යුද්ධය, ලේ වැගිරීම
iii. සාගතය.
iv. මරණය.

25. එළිදරව් සාහිත්‍යයේ පරිපූර්ණත්වය හඳුන්වන සංඛ්‍යාව වන්නේ,
i. 4.
ii. 7
iii. 10.
iv. 12.

26. පුරාණ ගිවිසුමේ ප්‍රඥාවේ අධිපතියා යන අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලබන්නේ,
i. දාවිත් රජතුමා.
ii. සලමොන් රජතුමා.
iii. සාවුල් රජතුමා.
iv. සීසර් රජතුමා.

27. ඔබගේ මිතුරා වන සුනිල් දැනට ගමේ තරුණ සමිතියේ සභාපතිත්වය දරයි. අනාගතයේ ඔහු දේශපාලන ක්ෂේත්‍රයට සම්බන්ධ වී රටේ ඉහළම තත්වයකට යාමට බලාපොරොත්තු වෙයි. එසේ නම් ඔහු ජීවිතයේ වැඩියෙන්ම ප්‍රගුණ කරගත යුතු ප්‍රඥා ප්‍රභේදය වන්නේ,
i. පවුල හා ගෝත්‍රික ප්‍රඥාව
ii. රාජ්‍ය සහා ප්‍රඥාව
iii. අභිධාර්මික ප්‍රඥාව
iv. එදිනෙදා ජීවිතය හා සම්බන්ධ ප්‍රඥාව

28. ජීවිත හරය එහි ගැටළු විනිශ්චය පිළිබඳ සංකල්ප ඉදිරිපත් කරන ප්‍රඥා ප්‍රභේදය වන්නේ,
i. පවුල හා ගෝත්‍රික ප්‍රඥාව
ii. රාජ්‍ය සහා ප්‍රඥාව
iii. අභිධාර්මික ප්‍රඥාව
iv. එදිනෙදා ජීවිතය හා සම්බන්ධ ප්‍රඥාව

29. ගිබියොන්හි පූජස්ථානයේ යාග පූජා දහසක් පුද කරන ලද්දේ කවුරුන්ද ?
i. දාවිත් රජතුමා.
ii. සලමොන් රජතුමා.
iii. ආබ්‍රහම්.
iv. මොසෙස්.

30. එළිදරව් සාහිත්‍යය ඉදිරිපත් කිරීමේ ප්‍රධාන ප්‍රයත්නය වන්නේ,
i. සංකේත සළකුණුවල වටිනාකම අවබෝධ කර දීමට
ii. අනතුරුවලින් ආරක්ෂාවීමට
iii. දෙවියන් වහන්සේ අදහා ගැනීමෙන් සදාතන ජීවිතය උරුම කර ගැනීමට
iv. තර්ජනයට ලක් වූ සැදැහැවතුන් දිරි ගැන්වීමට

31. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙහි කතුවරයා වන්නේ,
i. පේදුරුතුමන්
ii. ජුවාම් තුමන්
iii. පාවුලු තුමන්
iv. ලූක් තුමන්

32. ශුද්ධවූ බයිබලයේ අවසාන ග්‍රන්ථය ලෙස සලකනු ලබන්නේ,
i. දානියෙල් ග්‍රන්ථය
ii. එළිදරව් පොත
iii. ක්‍රියා පොත
iv. ජුද් ලිපිය

33. ශුද්ධවූ පාවුලු තුමන් විසින් පෞද්ගලිකව පුද්ගලයෙකුට ලියන ලද ලිපියක් ලෙස හඳුන්වන ලිපිය වන්නේ,
i. රෝම ලිපිය
ii. එපීස ලිපිය
iii. පිලමොන් ලිපිය
iv. 1 තෙසලෝනික ලිපිය

34. බොරු ගුරුවරුන්ගේ වැරදි ඉගැන්වීම නිවැරදි කිරීමට පාවුලු තුමන් විසින් ලියන ලද ලිපිය වන්නේ,
i. පිලිප්පි ලිපිය
ii. කොලොස්සි ලිපිය
iii. පිලමොන් ලිපිය
iv. ගලාති ලිපිය

35. පූරාණ ගිවිසුම තුළ ඊශ්‍රායෙල් ජනතාවගේ අත්දැකිම් සිද්ධීන් යනාදිය විශ්වාසයෙන් ඇසින් අර්ථකථනය කිරීමේ පරමාර්ථය වන්නේ,
i. දේව ජනතාව දිරි ගැන්වීමට
ii. දේව විශ්වාසය වර්ධනය කිරීමට
iii. දේව ගරු බිය වැඩි වර්ධනය කිරීමට
iv. දේව කැමැත්ත වටහා දීමට

36. ශුද්ධවූ බයිබලය ග්‍රන්ථාරූඪ වීමට ප්‍රථම දේව වචනය පරම්පරාවෙන් පරම්පරාවට මනුෂ්‍යයන්ට දායාද කරන ලද්දේ,
i. පූජක සම්ප්‍රදායෙනි
ii. එලොහිම් සම්ප්‍රදායෙනි
iii. වාචික සම්ප්‍රදායෙනි
iv. හැකුලුම්පත් ආධාරයෙනි.

37. වෙනත් හසුන් අතරින් අපෝස්තුළුවරයෙකු නොවන පුද්ගලයෙකු විසින් ලියන ලද එකම හසුන වන්නේ,
i. හේබ්‍රෙව් හසුන.
ii. ජාකොබ් හසුන.
iii. ජුද් හසුන.
iv. 3 ජොහාන් හසුන.

38. ශුද්ධ බයිබලයේ දේව වේදීය ඉතිහාස කථා ලෙස හඳුන්වන පොත් කාණ්ඩය වන්නේ,
i. නීති පොත්
ii. දිවැසිවර ග්‍රන්ථ
iii. එළිදරව් ග්‍රන්ථ
iv. ඉතිහාස පොත්

39. ශ්‍රී ලංකාවේ අපෝස්තුළුවරයා යන විරුදාවලියෙන් හඳුන්වනු ලබන්නේ,
i. කාදිනල් කුරේ හිමිපාණන්.
ii. මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්.
iii. ජාකෝමේ ගොන්සාල්වේස පියතුමා
iv. ශුද්ධවූ ජුසේ වාස් පියතුමා.

40. වර්තමාන කතෝලික සභාවේ දෘශ්‍යමාන එඩේරාණන් වන්නේ,
i. ශු පේදුරු තුමන්.
ii. ශු පාවුලු තුමන්.
iii. II වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා.
iv. පළමුවන ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා

Learning Resource Centre
R
De Mazenod College
Kandana
2024-06-

# ද මැසිනොද් විදුහල - කඳාන
## පළමුවාර පරීක්ෂණය - 2024
## කතෝලික ධර්මය II

10 ශ්‍රේණිය | කාලය පැය 02

**✳ පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් තෝරාගත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

01. 1. ශුද්ධවූ බයිබලයේ පංච පුස්තකයට අයත් ග්‍රන්ථ 02 ක් ලියන්න ?
2. නව ගිවිසුමෙහි "තියෝපිලස්" නැමැති උසස් නිලයක් දැරූ පුද්ගලයාට පිළිගන්වා ඇති ග්‍රන්ථ දෙක මොනවාද ?
3. පුරාණ ගිවිසුමේ ගීතාවලිය හඳුන්වන තවත් නම් දෙකක් ලියන්න.
4. ගීතාවලියේ විලාප ගීතිකා බෙදෙන ප්‍රධාන කොටස් 02 මොනවාද ?
5. කතෝලික ජනවන්දනාව තුළ ගීතාවලිය වැඩි වශයෙන් ප්‍රයෝජනයට ගන්නා ප්‍රධාන අවස්ථා 02 මොනවාද ?
6. රෝමයේ නීරෝ අධිරාජයාගේ පීඩනයට ලක් වූ කිතුනුවන් දිරිමත් කිරීමට ලියන ලද සුභාරංචිය වන්නේ කුමක්ද ?
7. නව ගිවිසුමේ වෙනත් ලිපි හඳුන්වන තවත් නම් දෙකක් ලියා දක්වන්න.
8. ශු. පාවුලු තුමන් හට ලිපි ලිවීමට සිදුවූයේ කුමන් අපහසුතාවයන් මග හරවා ගැනීමටද ?
9. ශු. පාවුලු තුමන් විසින්ම ලියන ලද ලිපි දෙකක් ලියා දක්වන්න.
10. ශු. බයිබලයේ එළිදරව් සාහිත්‍ය ග්‍රන්ථ දෙක මොනවාද ?

02. 1. නව ගිවිසුමේ සංදේශ වර්ගීකරණය කරන ප්‍රධාන කොටස් දෙක මොනවාද ?
2. නව ගිවිසුමේ ග්‍රන්ථ බෙදෙන ප්‍රධාන කොටස් 03 මොනවාද ?
3. දෙවියන් වහන්සේගේ මිත්‍රයෙකු වීමට ඔබට කළහැකි කාර්යයන් 05 ක් ලියන්න.

03. 1. දේව අනාවරණයේ ප්‍රධාන මූලාශ්‍ර දෙක මොනවාද ?
2. ශු. පාවුලු හසුන් වර්ගීකරණය කරන ප්‍රධාන කොටස් 03 මොනවාද ?
3. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙහි සැකැස්ම ලියා දක්වන්න.

04. 1. ශු. බයිබලයේ එළිදරව් සාහිත්‍ය ග්‍රන්ථවල සංකේත භාවිතයෙන් ඇති පරමාර්ථ මොනවාද ?
2. පහත දැක්වෙන සංඛ්‍යා සංකේත වල අර්ථය ලියා දක්වන්න.
   04 -
   07 -
   12 -
3. වර්තමාන සමාජය තුළ ඔබට දෙවියන් වහන්සේ අනාවරණය වන මාර්ග 05 ක් ලියා විස්තර කරන්න.

05. 1. ශුද්ධවූ බයිබලයේ එන ප්‍රඥා සාහිත්‍ය ග්‍රන්ථ 02 ක් ලියා දක්වන්න.
2. හෙබ්‍රෙව් ප්‍රඥාව ඉදිරිපත් කරන සාහිත්‍යමය ස්වරූප 03 ක් ලියන්න.
3. ඔබට එදිනෙදා ජීවිතයේ ප්‍රඥා සහගතව කටයුතු කිරීමට සිදුවන අවස්ථා 05 ක් ලියන්න.

06. 1. බැබිලෝනියානු විප්‍රවාසයෙන් පසු යුදා ජාතියේ සාමාජීය හා ආගමික ප්‍රතිස්ථාපනය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන ඉතිහාස ග්‍රන්ථ වන්නේ මොනවාද ?
2. ශු. ජොහාන් සුභාරංචියේ ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය ප්‍රකාශ වන "මම වෙමි" ප්‍රකාශන 03ක් ලියා දක්වන්න.
3. ඔබ ලෝකය තුළ ආලෝකයක් වන ආකාරය කරුණු 05 කින් විස්තර කරන්න.

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
1. සමදර්ශක සුභාරංචි
2. ශු බයිබලයේ කතෘත්වය
3. හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද
4. සුභාරංචිය පතල කිරීමට කතෝලික ලේඛකයකුගේ දායකත්වය